16 - මානව සම්පත් කළමණාකරණය

1.පහත සඳහන් කරුණු අතුරෙන් රැකියා විස්තරයක අඩංගු වන්නේ,

1.අධ්‍යාපන සුදුසුකම්ය.
2.තනතුරට අයත් කාර්යභාරය
3.මානව ගති ලක්ෂණය
4.පලපුරුද්දය
5.වෘත්තීය සුදුසුකම්ය

2.අභ්‍යන්තර ආකර්ෂණ මාර්ගවල වාසියකි.

1.සේවකයන් අතර තරඟය අඩුවීම.
2.ඉතාම යෝග්‍ය පුද්ගලයා බඳවා ගත හැකිවීම.
3.නව දැනුම,කුසලතා හා ආකල්ප සංවිධානයට ගලා ඒම.
4.තෝරා ගැනීමේ පිරිවැය අඩු වීම.
5.ශ්‍රම පිරිවැටුම ඉහළ යාම.

3.පුහුණුව හා සංවර්ධනයෙන් සේවා යෝජකයාට අත්වන ප්‍රතිලාභයක් නොවන්නේ,

1.සේවක කාර්ය සාධනය වර්ධනය වීම.
2.සේවක අභිප්‍රේරණය ඇති වීම.
3.සේවක ප්‍රවාසිතාව අඩුවීම.
4.උසස්වීම් සඳහා ඉඩකඩ පුළුල් වීම.
5.සේවක පිරිවැටුම අඩු වීම.

4.සේවක චලනයට අදාළ ක්‍රමයක් නොවන්නේ,

1.උසස් කිරීම
2.රැකියාස්ථ පුහුණුව
3.මාරු කිරීම
4.නවතාලීම
5.සේවය අවසන් කිරීම.

5.පහත දක්වා ඇත්තේ සේවක ආකර්ෂණ ක්‍රියාවලියට අදාළ පියවරය.

A - ආකර්ෂණ ක්‍රමය/ක්‍රම තෝරා ගැනීම
B - ආකර්ෂණයට අදාළ සාධක සලකා බැලීම
C - රැකියා ඇබෑර්තු හඳුනා ගැනීම
D - අයදුම්පත පිළියෙල කිරීම
E -රැකියා නියමයන් අධ්‍යයනය කිරීම
F - ක්‍රියාත්මක කිරීම
G - අයදුම්පත් ඇගයීම

ඉහත ආකර්ෂණ ක්‍රියාවලිය නිවැරදිව දක්වා ඇති වරණය වන්නේ,

1.C,E,D,A,B,F,G
2.E,A,B,D,C,G,F

3.C,E,B,D,A,F,G
4.F,G,A,C,B,D,E
5.B,C,E,D,A,F,G

6.පහත දැක්වෙන්නේ සේවක ආකර්ෂණ ක්‍රම කිහිපයකි.

A - කුසලතා ඉන්වෙන්ට්‍රි ලේඛන
B - අතීත සේවකයන් මගින්
C -රැකියා පොල මගින්
D -අභ්‍යන්තර ජාලය මගින්
E - වෘත්තීය සංගම් මගින්

ඉහත ක්‍රම අතුරින් අභ්‍යන්තර ආකර්ෂණ ක්‍රම පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
1.)A හා B 2.) D හාE 3.) C හා A 4.) B හා D 5.) A හාD

7.මානව සම්පත් සඳහා වූ ඉල්ලුම පුරෝකථනය කිරීමේදී සැලකිල්ලට ගනු ලබන සාධක පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1.රැකියා පිරිවිතරය/රැකියා විස්තරය/විශ්‍රාම යාම්/නිෂ්පාදන ක්‍රමය
2.ඉලක්ක හා සැලසුම්/නිෂ්පාදිත සඳහා වූ ඉල්ලුම/විශ්‍රාම යාම්/නිෂ්පාදන ක්‍රමය
3.ආකර්ෂණය හා තෝරා ගැනීම/බඳවා ගැනීම/ඉවත්ව යාම්/විශ්‍රාම යාම්
4.රැකියා පිරිවිතරය/රැකියා විස්තරය/ආකර්ශනය හා තෝරා ගැනීම/බඳවා ගැනීම
5.නිෂ්පාදන ක්‍රමය/නිෂ්පාදනය සඳහා වූ ඉල්ලුම/බඳවා ගැනීම්/පුහුණුව හා සංවර්ධනය

8.පුද්ගලයෙකු තෝරා ගැනීමේදී අදාළ රැකියාවේ නිශ්චිත කාර්ය ඉටු කිරීමට ඇති සැබෑ හැකියාව මැනිය හැක්කේ,

1.අයදුම්පත් ඇගයීම මගිනි
2.වෛද්‍ය පරීක්ෂණ මගිනි
3.පෞරුෂ පරීක්ෂණ මගිනි
4.ප්‍රායෝගික පරීක්ෂණ මගිනි
5.පසුබිම පරීක්ෂණ මගිනි

9.සේවක අයිතිවාසිකම්වලට නිදසුනක් වනුයේ,

1.සේවා ගිවිසුමට අනුව නිවාඩු ලබා ගැනීම.
2.ආයතනයේ දේපළ හා උපකරණ පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම.
3.ඉහළ වැටුපක් ලබා ගැනීමට
4.වැඩ ස්ථානයේ අවශ්‍ය ලෙස හැසිරීමට
5.තම අභිමතය පරිදි සේවයෙන් ඉවත් වීමට

10.පහත සඳහන් හැඳින්වීම් අතුරින් වැරදි හැඳින්වීම වන්නේ,

1.කාර්යඵල ඇගයීම යනු සේවකයා සිය රැකියාව කොතෙක් දුරට ඉටු කරන්නේද යන්න සොයා බලා වාර්තා කිරීමයි.
2.බඳවා ගැනීම යනු තෝරාගත් යෝග්‍යතම පුද්ගලයන් රැකියා තනතුරුවලට පත්කිරීමේ නීත්‍යානුකූල ක්‍රියාවලියයි.
3.රැකියා විශ්ලේෂණය යනු රැකියාවක කටයුතු,රාජකාරි හා වගකීම් පිළිබඳවත් එය සාර්ථකව ඉටු කිරීමට අවශ්‍ය සේවකයා සතු විය යුතු සුදුසුකම් පිළිබඳවත් කරනු ලබන විමර්ශනයකි.
4.අනුස්ථාපනය යනු අලුතින් බඳවා ගත් සේවකයන්ට සේවා ස්ථානයෙන් පරිබාහිරව පුහුණුව ලබා දීමයි.
5.සාමූහික කේවල් කිරීම යනු වෘත්තීය ගැටළු සම්බන්ධයෙන් වෘත්තීය සමිතිය හා කළමණාකරණය අතර පවත්නා සාකච්ඡාවයි.

11.රැකියාව,එහි කාර්යභාරය හා වගකීම පැහැදිලි කරනු ලබන මානව සම්පත් කළමනාකරණ කාර්යය,

1.රැකියා විග්‍රහය
2.රැකියා පිරිවිතරය
3.රැකියා ඇගයීම
4.අනුස්ථාපනය
5.රැකියා නිර්මාණය

<u>පිළිතුරු</u>

| | | | | | |
|---|---|---|---|---|---|
| **1.) 2** | **2.) 4** | **3.)4** | **4.)2** | **5.)3** | **6.)5** |
| **7.)2** | **8.)4** | **9.)1** | **10.)4** | **11.)5** | |

**ටී.කේ.සම්පත් සිරිශාන්ත මයා**
**ර/ශ්‍රී රාහුල මහා විද්‍යාලය,**
**ලෙල්ලොපිටිය.**